සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

**කෘෂි හා ආහාර තාක්ෂණය - I -** කාලය : පැය 03 යි.

- සැලකිය යුතුයි:-
  - (i) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
  - (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
  - (iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✗) ලකුණ යොදන්න.
  - (iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. පහත සඳහන් බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රම අතුරින් නැගෙනහිර පළාත සංවර්ධනය කිරීම සඳහා ආරම්භකළ බහු කාර්ය යෝජනා ක්‍රමය වන්නේ
    (i) ගල්ඔය යෝජනා ක්‍රමයයි. (ii) උඩවලව යෝජනා ක්‍රමයයි.
    (iii) නිල්වලා යෝජනා ක්‍රමයයි. (iv) ලුණුගම් වෙහෙර යෝජනා ක්‍රමයයි.

02. තේ, රබර් හා පොල් යන බෝග සඳහා පර්යේෂණ ආයතන පිහිටා ඇති ස්ථාන පිළිවලින් දක්වෙන්නේ
    (i) බතලගොඩ, පැල්මැහැර, ගන්නොරුව ය. (ii) තලවකැලේ, අගලවත්ත, ලුණුවිලය
    (iii) ලබුදූව, අම්බලන්තොට, මහඉලුප්පල්ලම ය. (iv) හොරග, ගන්නොරුව, බෝමුවලය.

03. ශ්‍රී ලංකාවේ කෘෂි දේශගුණික කලාප සංඛ්‍යාව
    (i) තුනකි (ii) පහකි (iii) හතකි (iv) නවයකි

04. සරල වර්ෂා මානයට සාපේක්ෂව ස්වයංක්‍රීය වර්ෂාමානය භාවිතා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ
    (i) යම් දිනයක් තුළ වර්ෂාව පැවති කාලසීමාව දැනගැනීමට හැකිවන නිසාය.
    (ii) වර්ෂාව පැවති ස්ථානය දැන ගැනීමට හැකිවන නිසාය.
    (iii) වර්ෂාපතනය මෙන්ම සාපේක්ෂ ආර්ද්‍රතාවය ද දැනගත හැකිවන නිසාය.
    (iv) වර්ෂාපතනය හා වාෂ්පීකරණ ප්‍රමානය ද දැනගත හැකිවන නිසාය.

05. කෘෂිකර්මාන්තය සඳහා හිතකර වූ විවිධ පරිසර තත්ව පැවතීම නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට උපකාරී වේ. මෙයින් පරිසර තත්ත්වයක් ලෙස සලකනු ලබන්නේ
    (i) ප්‍රාග්ධනයයි (ii) ශ්‍රමයයි (iii) භූ විෂමතාවයයි (iv) ව්‍යවසාය තත්ත්වයයි

06. ආම්ලික පසක අඩුවෙන්ම පවතින අයන වර්ගයකි
    (i) නයිට්‍රජන් අයන (ii) ඇලුමිනියම් අයන (iii) සෝඩියම් අයන (iv) යකඩ අයන

07. රතු කහ පොඩ්සොලික් පස බහුලව ව්‍යාප්තව ඇති ප්‍රදේශයකි
    (i) අනුරාධපුරයයි (ii) කෑගල්ලයි (iii) පොළොන්නරුවයි (iv) මොනරාගලයි.

08. පාංශු ව්‍යුහය විනාශවීමට බලපාන සාධකයකි.
    (i) පසට කාබනික ද්‍රව්‍ය යෙදීමයි. (ii) පාංශු පුනරුත්තාපන ක්‍රම යෙදීමයි.
    (iii) ජලවහනය දුර්වලවීමයි. (iv) නියමිත ගැඹුරට පස පෙරළීමයි.

09. පාංශු ඛාදනය අවම කිරීමට ඉක්මනින් පස ආවරනය කරන බෝග කාණ්ඩය වන්නේ
    (i) තේ හා ගම්මිරිස් ය. (ii) කරවිල හා වැටකොලුය
    (iii) මුං හා තක්කාලිය (iv) බතල හා වට්ටක්කාය.

10. දේශීය ආහාර නිෂ්පාදනය නැංවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය වන්නේ
    (i) 1902 දීය. (ii) 1912 දීය. (iii) 1922 දීය. (iv) 1932 දීය.

11. වැව් බැම්මට ජලය මගින් ඇතිවන පීඩනය අවම කරමින් වාරි ජලය මුදා හැරීමට ඉදි කරන ලද සුවිශේෂී නිර්මාණයකි
(i) රළපනාවයි (ii) සොරොව්වයි (iii) බිසෝකොටුවයි (iv) වාරි මාර්ග ඇලයි

12. පළමු අන්තර් මෝසම් ඍතුව අයත් වන මාස වන්නේ
(i) මාර්තු සිට අප්‍රේල් දක්වාය. (ii) ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වාය.
(iii) අප්‍රේල් සිට මැයි දක්වාය. (iv) නොවැම්බර් සිට දෙසැම්බර් දක්වාය.

13. වියළි කලාපයේ ගොවීන් මහ කන්නයේ දී වගා කරනු ලබන්නේ
(i) අල භෝග වගාවය. (ii) වී වගාවය.
(iii) එළවළු වගාවය. (iv) පළතුරු වගාවය.

14. ග්‍රැනයිට් පාෂාණ විපරිත වීමෙන් සෑදෙන පාෂාණ වර්ගයකි.
(i) තිරුවානා (ii) හුණුගල් (iii) නයිෂ් (iv) ෂේල්

15. බෝග වගාවට සුදුසු පසක තිබිය යුතු කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතය විය යුත්තේ
(i) 20%කි. (ii) 15%කි. (iii) 10%කි. (iv) 5%කි.

16. අන්තර් ජාතික පාංශු විද්‍යා වර්ගීකරණය යටතේ අංශුවල විශ්කම්භය අනුව පාංශු ඛනිජ පිහිටා ඇති අනු පිළිවෙල නිවැරදිව දක්වා ඇත්තේ
(i) රොන් මඩ, සියුම් වැලි, බොරලු, රළු වැලි, මැටි (ii) මැටි, රොන්මඩ, සියුම්වැලි, රළුවැලි, බොරලු
(iii) සියුම්වැලි, රොන්මඩ, රළුවැලි, බොරලු, මැටි (iv) රොන්මඩ, රළුවැලි, සියුම්වැලි, මැටි, බොරලු

17. බෝග වගාවේ දී ශාකවලට අවශෝෂණය කරගත හැකි පසේ පැවතිය යුතු ජලය වන්නේ
(i) ගුරුත්වාකර්ෂණ ජලයයි. (ii) ජලාකර්ෂණ ජලයයි.
(iii) කේෂාකර්ෂණ ජලයයි. (iv) භූගත ජලයයි.

18. පාංශු රසායනික ලක්ෂණයකි.
(i) පාංශු වයනයයි. (ii) පාංශු ව්‍යුහයයි.
(iii) කැටායන හුවමාරු ධාරිතාවයි. (iv) පාංශු ගැඹුරයි.

19. පාංශු ක්ෂාරීයතාවය උදාසීන කිරීම සඳහා පසට
(i) ජිප්සම් යොදයි. (ii)
(iii) ඩොලමයිට් යොදයි. (iv) කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් යොදයි.

20. මැටි පසක් හා සංසන්දනය කරන විට වැලි පසක දක්නට ලැබෙන ලක්ෂණයකි.
(i) අවකාශ අඩුය. (ii) වයනය රළුය.
(iii) ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩිය. (iv) පාංශු වාතය අඩුය.

21. පසක් ආම්ලික වීමට බලපාන හේතු කීපයක් පහත දක්වේ.
A ලවන සහිත වාරි ජලය සැපයීම
B අම්ල වැසි ඇතිවීම
C අධික වර්ෂාපතනයක් දීර්ඝ කාලයක් පැවතීම
ඉහත ප්‍රකාශයන් අතරින් නිවැරදි ප්‍රකාශයක් වන්නේ
(i) A - B පමණි (ii) A - C පමණි. (iii) B C පමණි (iv) A B C සියල්ලම ය.

22. ආලෝක කාලය ලෙස කෘෂිකර්මයේ දී හඳුන්වනු ලබන්නේ
(i) සූර්යාලෝකය ලැබෙන ප්‍රමාණයයි.
(ii) දිනක් තුළ ලැබෙන ආලෝක කාලසීමාවයි.
(iii) බෝග වගාවට සූර්යාලෝකයේ එක් එක් වර්ගයන්ගේ බලපෑමයි.
(iv) ඉහත සඳහන් සියල්ලමයි.

23. තෙත් කලාපයට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ
(i) ඊසාන දිග මෝසම් වර්ෂාව මගින් ය. (ii) වාසුළි වර්ෂාව මගින් ය.
(iii) නිරිත දිග මෝසම් වර්ෂාව මගින් ය. (iv) සංවහන වර්ෂාව මගින් ය.

24. වැඩි ආලෝක තීව්‍රතාවක් ප්‍රිය කරන ශාඛ කාණ්ඩය වනුයේ
(i) ඇන්තූරියම්, ඕකිඩ් (ii) මිරිස්, වම්බටු (iii) ගම්මිරිස්, බිගෝනියා (iv) මිරිස්, කෝපි

25. නව යන්ත්‍රෝපකරණ, වැඩි දියුණු කරන ලද බෝග ප්‍රභේද කෘෂි රසායන ද්‍රව්‍ය හා කෘත්‍රිම පොහොර භාවිතය නිසා විශාල ලෙස කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිවීම හඳුන්වනු ලබනුයේ
(i) කෘෂිකාර්මික විප්ලවයයි. (ii) තාක්ෂණික විප්ලවයයි.
(iii) කාර්මික විප්ලවයයි. (iv) හරිත විප්ලවයයි.

26. ආලෝකයේ විවිධ වර්ණ ශාකවල විවිධ ක්‍රියාකාරී අවස්ථා සඳහා උපකාරී වේ. නිල් හා රතු ආලෝකය මගින්
(i) අතු බෙදීමට හිතකර වේ. (ii) බීජ ප්‍රරෝහනයට හිතකර වේ.
(iii) ප්‍රභාසංස්ලේෂණයට හිතකර වේ. (iv) බීජාධරයේ වර්ධනයට හිතකර වේ.

27. දුර්වල පාංශු ව්‍යුහයක් ඇති පසක් වගාවට සුදුසු තත්ත්වයට පත්කර ගැනීම සඳහා කල යුත්තේ
(i) පසට යූරියා යෙදීමයි. (ii) පසට අලු එකතු කිරීමයි.
(iii) පසට කාබනික පොහොර එකතු කිරීමයි. (iv) පසට ඩොලමයිට් එකතු කිරීමයි.

28. ශ්‍රී ලංකාවේ සෑම දිනකම දිවා කාලයේ දිග එක සමාන නොවේ. කෙටිම දිවා කාලය හා දිගුම දිවා කාලය අතර ඇති වෙනස විය යුත්තේ
(i) මිනිත්තු 40කි. (ii) මිනිත්තු 45කි. (iii) මිනිත්තු 50කි. (iv) මිනිත්තු 55කි.

29. බෝගයකට පොහොර යෙදූ විගස වර්ෂාවක් ඇතිවුවද එම පොහොර සේදී නොගොස් පසේ රඳා පැවතීමට හේතු වන්නේ
(i) පසේ කැටායන හුවමාරු ධාරිතාවයි. (ii) පසේ පවතින පාංශු වාත ප්‍රමාණයයි.
(iii) පසේ ආම්ලික තාවයයි. (iv) පසේ ක්ෂාරීයතාවයයි.

30. පසේ භෞතික රසායනික සහ ජෛව ගුණාංග වගාවට අයහපත්වීමෙන් පසේ බෝග නිෂ්පාදන ශක්තිය හීනවීම හඳුන්වන්නේ
(i) පස පුනරුත්ථාපනයයි. (ii) පාංශු ඛාදනයයි.
(iii) පාංශු හායනයයි. (iv) පාංශු ව්‍යුහයයි.

31. pH අගය 4.5 - 6.5 දක්වා පස
(i) ප්‍රබල ආම්ලික පසකි. (ii) ආම්ලික පසකි.
(iii) උදාසීන පසකි. (iv) භාෂ්මික පසකි.

32. ආර්ද්‍රතාවය නිතර වෙනස් වීමට භාජනය වන්නේ
(i) වර්ෂාපතනය හා සුළඟ නිසාය. (ii) උෂ්ණත්වය හා සුළඟ නිසාය.
(iii) ආලෝකය හා වර්ෂාපතනය නිසාය. (iv) උෂ්ණත්වය හා වර්ෂාපතනය නිසාය.

33. ශ්‍රී ලංකාවේ දැකිය හැකි පාංශු ව්‍යුහාකාර ගණන
(i) 2 කි. (ii) 3කි. (iii) 4 කි. (iv) 5 කි.

34. WM සංකේතයෙන් හඳුන්වන දේශගුණික කලාපය කුමක් ද?
(i) උඩරට තෙත් කලාපයයි. (ii) මැද රට තෙත් කලාපයයි.
(iii) පහතරට තෙත් කලාපයයි. (iv) පහත රට වියළි කලාපයයි.

35. වාර්ෂික වර්ෂාපතනය මි. මී. 2500 හෝ ඊට වැඩි දේශගුණික කලාපය ලෙස සැලකෙන්නේ
(i) වියලි කලාපයයි. (ii) තෙත් කලාපයයි (iii) අතරමැදි කලාපයයි (iv) අර්ධ ශුෂ්ක කලාපයයි.

36. වැලි පසක වගා කිරීමට සුදුසු බෝග කාන්ඩයකි.
(i) මිරිස් හා බණ්ඩක්කා (ii) වම්බටු හා තක්කාලි
(iii) වී හා කොහිල (iv) බතල හා රටකජු

37. මන්සල් වර්ග සටහන උපයෝගී කරගෙන පාංශු වර්ණය නිවැරදිව තීරණය කර ගනී. ඒ අනුව පස රතු පැහැයක් ගනුයේ
(i) කැල්සියම් අධික නිසාය. (ii) යකඩ අධික නිසාය.
(iii) ඩොලමයිට් අධික නිසාය. (iv) කාබනේට් අධික නිසාය.

38. කලු පැහැයට හුරු පස බීජ ප්‍රරෝහනයට හිතකර වන්නේ එහි
(i) කාබනික ද්‍රව්‍ය අධික නිසාය. (ii) පාංශු ජලය අධික නිසාය.
(iii) තාපය උරා ගන්නා නිසාය. (iv) පාංශු ජීවීන් අධික නිසාය.

39. මහ කන්නයේ අස්වනු නෙලීම සිදුවන මාසය විය හැක්කේ
(i) පෙබරවාරි මාසයේ දීය. (ii) අප්‍රේල් මාසයේ දීය.
(iii) ජුනි මාසයේ දීය. (iv) අගෝස්තු මාසයේ දීය.

40. ශ්‍රී ලංකාවේ පුරාණ රජ දවස කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ලොව මවිතයට පත්කළ රටකි. එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ,
(i) රසායනික පොහොර භාවිතයෙන් තොරව වගා කිරීමයි.
(ii) ස්වාභාවික සම්පත් හා ශ්‍රමය කාර්යක්ෂම යොදා ගැනීමයි.
(iii) විවිධ බෝග සංකලනය මගින් ශාක රෝග හා පළිබෝධ පාලනය කර ගැනීමයි.
(iv) උසස් වාරි තාක්ෂණයක් යොදා ගැනීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

81 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

### කෘෂි හා ආහාර තාක්ෂණය - II

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයටකට ලකුණු 10 බැගින් හිමිවේ.

01. යම්කිසි ප්‍රදේශයකට ගැළපෙන බෝග තෝරා ගැනීමටත් බෝග අස්වනු වැඩිකර ගැනීමටත් අහිතකර කාලගුණ තත්ත්ව නිසා සිදුවන බෝග පාළුවීම් අවම කර ගැනීමටත් එම ප්‍රදේශයේ පවතින දේශගුණික හා කාලගුණික පරාමිති පිළිබඳව දැනසිටීම ඉතා වැදගත් ය.

(i) කාලගුණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න.
(ii) කාලගුණික පරාමිති දෙකක් සඳහන් කරන්න.
(iii) වර්ෂාපතනය මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කරන්න.
(iv) වර්ෂාපතනය මැනීම සඳහා භාවිතා වන සම්මත ඒකකය සඳහන් කරන්න.
(v) බෝග වගාවට සුළඟ මගින් ඇතිවන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.
(vi) පරිසර උෂ්ණත්වය වෙනස්වීම සඳහා බලපාන සාධක දෙකක් දක්වන්න.
(vii) ප්‍රධාන වශයෙන් වියලි කලාපයට වර්ෂාව ලැබෙන වර්ෂාපතන ක්‍රමය නම් කරන්න.
(viii) එම වර්ෂාපතන රටාවට අනුව වැසි ලැබෙන කාලසීමාව දක්වන්න.
(ix) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම් දෙකක් ලියන්න.
(x) බෝග වගාව කෙරෙහි සාපේක්ෂ ආර්ද්‍රතාවයේ හිතකර බලපෑම් දෙකක් නම් කරන්න.

02. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ ඓතිහාසික පසුබිම දෙස බැලීමේ දී ස්වයංපෝෂිත අර්ථක්‍රමයක් පැවති බවට කොතෙකුත් සාක්ෂි තිබේ.

(i) a. මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පිදුම් ලැබූ රජතුමා නම්කර ඉටු වූ සුවිශේෂී සේවාවක් නම් කරන්න.
b. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට ඇති විභවයන් දෙකක් දක්වන්න.
(ii) විදේශ ආක්‍රමණ නිසා ශ්‍රී ලංකා කෘෂි ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
(iii) a. හරිත විප්ලවයත් සමග කෘෂි කර්මාන්තයේ සිදු වූ වෙනස්කම් දෙකක් දක්වන්න.
b. විදේශ වෙළෙඳපොළ ඉලක්ක කරගත් සාම්ප්‍රදායික නොවන කෘෂි නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න.

03. දර්ශීය පාංශු පැතිකඩක ප්‍රධාන කලාප පෙන්වන රූප සටහනක් පහතින් දක්වා ඇත.




(i) A, B, C, R කලාප නම් කරන්න.
(ii) A කලාපයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(iii) a. පාංශු ගැඹුර කෙටියෙන් හඳුන්වන්න.
b. පාංශු ඛනිජ ලෙස හඳුන්වන්නේ කුමක් ද?

04. බෝග වගාවේ දී පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය ඉතා වැදගත්ය.

(i) a. බෝග වගාවේ දී පාංශු ජීවීන්ගේ වැදගත්කම් දෙකක් නම් කරන්න.

b. පාංශු ජීවීන්ගෙන් බෝගවගාවට ඇතිවිය හැකි අහිතකර බලපෑම් දෙකක් දක්වන්න.

(ii) a. පාංශු ජීවීන් වර්ගීකරණය කරන්න.

b. ඉහත වර්ගීකරණයට උදාහරණ දෙක බැගින් දක්වන්න.

(iii) පාංශු සංරක්ෂණය කළ හැකි යාන්ත්‍රික ක්‍රම දෙකක් හඳුන්වන්න.

05. බෝග වර්ධනය සඳහා පස මගින් සුවිශේෂී කාර්යයක් ඉටු කරයි.

(i) a. පස නිර්මාණය වීමේ ක්‍රියාවලිය දක්වන්න.

b. පස නිර්මාණය වීමට මූලික වන පාෂාණ වර්ග තුනක් නම් කරන්න.

(ii) a. භෞතික පාෂාණ ජීර්ණයට බලපාන සාධක දෙකක් නම් කරන්න.

b. පසක අඩංගු වන පාංශු සංඝටක නම් කරන්න.

(iii) බෝගවලට ජල සම්පාදනය කිරීමේ දී අවශ්‍යවන පරාමිති සඳහන් කරන්න.

06. අවිධිමත් කෘෂි කාර්මික කටයුතු හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පස පිරිහීම නිසා බෝග නිෂ්පාදන ශක්තිය ද අඩුවේ.

(i) a. පාංශු ඛාදනය කෙටියෙන් හඳුන්වන්න.

b. පාංශු ඛාදන කාරක දෙකක් දක්වන්න.

(ii) පාංශු ඛාදන ක්‍රියාවලියේ අවස්ථා පිළිවෙලින් සඳහන් කරන්න.

(iii) a. පාංශු ඛාදනයෙන් සිදුවන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

b. පාංශු ඛාදනය වළක්වා ගැනීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

07. වගා කටයුතු ගළපා ගැනීමේ පහසුව සඳහා කෘෂි පාරිසරික කලාප බෙදා දක්වා ඇත.

(i) a. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප නම් කරන්න.

b. එම කලාපවලින් වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන කලාපයට ද?

(ii) ප්‍රධාන දේශගුණික කලාප උච්චත්වය අනුව බෙදා වෙන්කර ඇත. එම උප කලාප නම් කර, උච්චත්වය දක්වන්න.

(iii) පරිසර උෂ්ණත්වය ප්‍රදේශ අනුව වෙනස් වේ. මෙම වෙනස්වීම කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# Provincial Department of Education - NWP

| 81 | S | I-II |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

### කෘෂි හා ආහාර තාක්ෂණය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 3 | 21. | 3 | 31. | 2 |
| 02. | 2 | 12. | 1 | 22. | 2 | 32. | 2 |
| 03. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 3 |
| 04. | 1 | 14. | 3 | 24. | 2 | 34. | 2 |
| 05. | 3 | 15. | 4 | 25. | 4 | 35. | 2 |
| 06. | 3 | 16. | 2 | 26. | 3 | 36. | 4 |
| 07. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 2 |
| 08. | 3 | 18. | 3 | 28. | 3 | 38. | 3 |
| 09. | 4 | 19. | 1 | 29. | 1 | 39. | 1 |
| 10. | 2 | 20. | 2 | 30. | 3 | 40. | 4 |

(ල. - 1 × 40 = 40)

### II කොටස

01. (i) යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය ල. 02

(ii) * වර්ෂාපතනය, උෂ්ණත්වය, ආලෝකය, සාපේක්ෂ ආර්ද්‍රතාව, සුළඟ ල. 02

(iii) * වර්ෂාමානය - 02

(iv) * මිලි මීටර් - 02

(v) * පත්‍ර ඉරී යාමෙන් අස්වනු අඩුවීම
* පළිබෝධ ව්‍යාප්තිය වැඩිවීම
* මල් හා ඵල හැලීයාම ල. 02යි
(අදාළ වෙනත් කරුණු ඇත්නම් ලකුණ ලබා දෙන්න.)

(vi) * උච්චත්වය, සමකයේ සිට ඇති දුර
* මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
* වන ගහණය
* අභ්‍යන්තර ජලාශ පිහිටා තිබීම
* මිනිස් ක්‍රියාකාරකම් ල. 02

(vii) * ඊසාන දිග මෝසම ල. 02

(viii)* දෙසැම්බර් - පෙබරවාරි දක්වා ල. 02

(ix) * ඒ ඒ කලාපයට සුදුසු බෝග නිර්දේශ කළ හැකි වීම.
* සමාකාර දේශගුණික තත්ත්ව ඇති ප්‍රදේශ හඳුනාගත හැකි වීම.
* යල හා මහ කන්න අනුව වගාකටයුතු සැලසුම් කිරීම. ල. 02
(අදාළ වෙනත් කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(x) * දඬු කැබලි මුල් ඇද්දවීම හොඳින් සිදුවීම.
* පරාගනයේ දී කලංකය ග්‍රාහීය කාලය පවත්වා ගැනීම පහසුවීම.
* විසිතුරු ශාක හොඳින් වර්ධනය වීම (බිගෝනියා, පර්ණාංග ආදී ල. 02

02. (i) a. මහසෙන් රජු ල. 01
කෘෂිකර්මාන්තයට ජල සම්පාදනය සඳහා ඉහළ අනුග්‍රහයක් දැක්වීම - 01

b. *කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය සම්පත් තිබීම. උදා: භූමිය, ජලය, ශ්‍රමය - 02
* හිතකර පරිසර තත්ත්ව පැවතීම
(වෙනත් අදාළ වූ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.) ල. 1/2 × 2 = 01

(ii) a. * ස්වයංපෝෂිත ග්‍රාමීය කෘෂි ආර්ථිකයේ බලපෑම
* තේ, පොල්, රබර් ආදී වැවිලි බෝග මත වානිජ කෘෂි ආර්ථිකයක් බිහිවීම. 02

b. * කෘෂි නිෂ්පාදන ඉහළ දැමීම
* ඉඩම් නොමැති අයට ඉඩම් ලබාදීම.
* ජල විදුලිය නිපදවීම.
* රැකියා සැපයීම
(වෙනත් අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.) 02

(iii) a. * මෙතෙක් වගාකළ එක් කන්නය වෙනුවට කන්න 02ක් වගා කිරීම.
* ලෝක ධාන්‍ය නිෂ්පාදනය දෙගුණයකින් පමණ වැඩිවීම.
* කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ලබාදෙන බීජ හඳුන්වා දීම.
*අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීමට ප්‍රමුඛතාව දීම.
(වෙනත් අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.) 02

b. * විසිතුරු මල් පැල වගාව
* ඉස්සන් වගාව
* විසිතුරු මත්ස්‍ය වගාව
* පැළ තවාන්
* බිම්මල් වගාව
* වානිජ මී මැසි පාලනය ල. 02
(වෙනත් අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

**Answer**

03. (i) A විශෝධන කලාපය
B සංචායක කලාපය
C මාතෘ ද්‍රව්‍ය
R මාතෘ පාෂාණයයි 1 × 4 = 04

(ii) a. *ඓන්ද්‍රීය ද්‍රව්‍ය බහුලයි
*ඓන්ද්‍රීය ද්‍රව්‍ය බහුලව ඇති නිසා මෙම පස් තට්ටුව කලු පැහැයෙන් යුක්තයි. 02

(iii) a. A, B හා C කලාපවල මුළු උස ල. 02
b. ජීර්ණය වූ පාෂාණ කොටස් ල. 02

04. (i) a. * කාබනික ද්‍රව්‍ය වියෝජනය
* පස මිශ්‍ර කිරීම
* පාංශු කැටිති ඇතිවීම.
* නයිට්‍රජන් තිරකරයි. 1 × 2 = ල. 02

b. * ශාකවලට රෝග බෝවීම
* නයිට්‍රිහරණය
* ශාකවලට පළිබෝධ ලෙස ක්‍රියාකිරීම. ල. 02

(ii) a. මහා ජීවීන් හා ක්ෂුද්‍ර ජීවීන් නම් කිරීමට ල. 02

b. **මහා ජීවීන්**
උදා:- කෘමීන්, වෙයන්, කුහුඹුවන්
**ක්ෂුද්‍ර ජීවීන්**
උදා:- ඇල්ගී, දිලීර, බැක්ටීරියා ල. 02

(iii) * සමෝච්ච කාණු යෙදීම
සමෝච්ච ක්‍රමයට පස් වැටි දැමීම
(වෙනත් අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.)
1 × 2 = ල. 02

05. (i) a. පාෂාණ —(පා. ජීර්ණය)→ මාතෘ ද්‍රව්‍ය —(පා. ජීර්ණය)→ පස ල. 02

b. ආග්නේය පාෂාණ
අවසාධිත පාෂාණ
විපරීත පාෂාණ ල. 02

(ii) a. * උෂ්ණත්වය වෙනස්වීම
* ජලය මිදීම
*ගලා යන ජලය
* රැලි ක්‍රියා 1 × 2 ල. 02
(අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

b. ඝන ද්‍රව්‍ය
පාංශු වාතය
පාංශු ජලය
පාංශු ජීවීන් 1 × 2 ල. 02

(iii) ක්ෂේත්‍රධාරිතාව හා මැළවීමේ අංකය
1 × 2 ල. 02

06. (i) a. * යම් ස්ථානයක පිහිටි පස් පාංශු සමූහන හෝ අංශු ලෙස පාංශු දේහයෙන් වෙන් වී වෙනත් ස්ථානයක් වෙත ගසාගෙන ගොස් තැන්පත් වීම. ල. 02

b. *වර්ෂා ජලය * වේගවත් සුළඟ
* මුහුදු රළ හා ගංගා රළ
* මිනිසුන්ගේ සතුන්ගේ ක්‍රියාකාරකම්
ල. 02

(ii) 1. පාංශු දේහයෙන් පාංශු අංශු හා සමූහන වෙන්වීම.
2. වෙන් වූ පාංශු සමූහන හා පාංශු අංශු වෙනත් ස්ථානයක් වෙත ගසාගෙන යාම.
3. එලෙස ගසාගෙන ආ පාංශු කොටස් වෙනත් ස්ථානයක තැන්පත් වීම. 1 × 2 ල. 02

(iii) a. ශාක පෝෂණ ඌනතා ඇතිවීම.
ශාක වර්ධනයට සුදුසු පාංශු ස්ථරයේ ගැඹුර අඩුවීම. 1 × 2 ල. 02

b. ආවරණ බෝගවගාව, වසුන් යෙදීම
සුදුසු බිම්සැකසීමේ ක්‍රමය
පාංශු පුනරුත්ථාපන බෝග වැවීම
ල. 1 × 2 = 02

07. (i) a. තෙත් කලාපය
අතරමැද කලාපය
වියළි කලාපය ල. 03
b. තෙත් කලාපය ල. 01

(ii) උඩරට - උච්චත්වය 900m වැඩි
මැදරට - උච්චත්වය 300 - 900m අතර
පහතරට - උච්චත්වය 300m අඩු
කලාප නම් කිරීමට - ල. 02
උච්චත්වය දැක්වීමට - ල. 02

(iii) * සමකයේ සිට ඇති දුර
* උච්චත්වය
* වන ගහණය ල. 1 × 2 = 02
(අදාළ කරුණු ඇත්නම් ලකුණු ලබා දෙන්න.)